## රෙදිපිළි පංගු මණ්ඩලය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට රෙදිපිළි පංගු මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ලැබිය යුතු ගිණුම්

සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් 2010 වර්ෂයේ සිට අයවිය යුතුව තිබූ රු. 94,316 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මු.රෙ. 1645 (අ) | මණ්ඩලය සතුව පැවති වාහනය සඳහා ලොග් පොතක් පවත්වා නොතිබුණි. |
| (ආ) | 1990 ඔක්තෝම්බර් 10 දින හා අංක 41/90 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මෝටර් වාහනවල ඉන්ධන දහනය පිළිබඳ අසාමාන්‍ය විචලනයක් තිබේදැයි දැන ගැනීම පිණිස මාස 6 කට වරක් පරීක්ෂාවක් කල යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ඇ) | 2008 ජූනි 26 දින හා අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | වාහන දීමනාව ලබා ගන්නා නිලධාරීන්ට රජයේ වාහනයක් පාවිච්චි කිරීමට කිසිදු හිමිකමක් නොමැති වුවත් වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරිය වාහන දීමනාව ලබා ගනිමින් තවත් මෝටර් රථයක් පාවිච්චි කර තිබුණි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කර නොතිබුණි. |

(ඉ) 2009 සැප්තැම්බර් 01 දිනැති ස්ථාවර වත්කම් ලේඛනයේ වත්කම්, පිරිවැය විස්තර, වත්කම් අංක බීඑම්ඒ/2009/(2) දරණ අපහරණය කිරීම් හා වත්කම් හරි වැරදි බැලීම පිළිබඳ විස්තර භාණ්ඩාගාර කලමණාකරණ විගණන කිසිවක් සඳහන් කර නොතිබුණි.
චක්‍රලේඛය

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලින් හා සේවක වන්දි ගෙවීමෙන් පසු රු.14,430,526 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,286,405 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,716,931 ක එනම් 731% ක පිරිහීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවය සඳහා සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 10 දෙනෙකු සේවයෙන් ඉවත් කිරීම වෙනුවෙන් ගෙවන ලද රු.11,310,546 ක සේවක වන්දිය ප්‍රධාන වශයෙන් හේතු වී තිබූ අතර පොළී ආදායම 39 % කින්ද සේවා ගාස්තු ආදායම 59 % කින්ද ප්‍රමාද ගාස්තු ආදායම සහ වෙනත් ආදායම් 82 % කින්ද සහ වැට් ලියාපදිංචි ආදායම් 49 % කින් අඩුවීම් ද බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

2011 වර්ෂයට අදාල මණ්ඩලයේ කාර්ය සාධනය ඇගයීමට අවශ්‍ය ලියාපදිංචි ඇහළුම් කම්හල් ගණන, දැනට ක්‍රියාත්මක ඇහළුම් කම්හල් ගණන, බදු ගෙවීමට අයත් ආයතන ගණන, අවලංගු වූ ආයතන ගණන සහ වසා දමන ලද ආයතන ගණන සඳහන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකල හෙයින් 2011 වර්ෂයේ කාර්ය සාධනය ඇගයීමට නොහැකි විණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

රෙදිපිළි පංගු මණ්ඩලය කලින් පවත්වාගෙන ගිය කුලියට ගත් ගොඩනැගිල්ලේ අභ්‍යන්තර වෙන්කිරීමට අදාල ගොඩනැගිලි ද්‍රව්‍ය (Partition) රු.65,700 කට මිලදී ගැනීමට ගනුදෙනුකරුවකු ඉදිරිපත්ව තිබියදී එය නොසලකා හැර ගොඩනැගිලි හිමියාට නොමිලේ ලබා දීමට කටයුතු කර තිබුණි.

3.3 **මතභේදයට තුඩුදෙන ගනුදෙන**

2009 සැප්තැම්බර් 22 දින සිට 2011 මාර්තු 10 දින දක්වා නිවාඩු අනුමත කරවා ගැනීමකින් තොරව විදේශ ගත වූ නිලධාරිනියකගේ සේවය, සේවය හැර ගියා සේ සලකා ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7.1 වගන්තිය ප්‍රකාරව සේවයෙන් ඉවත් නොකර නැවත සේවයේ පිහිටුවා තිබුණි. තවද, සේවය නොකළ කාලපරිච්ඡේදය සඳහා වූ වැටුප් වර්ධක 03 ක් ලබාදීමෙන් මාස 06 කට පසුව සේවක වන්දිය ලෙස රු.1,383,491 ක් රැගෙන ඇය සේවයෙන් ඉවත්ව ගොස් තිබුණි.

3.4 **හඳුනා ගන්නා ලද පාඩු**

මණ්ඩලය ඇවර කිරීමට සිදු වන බැවින් සේවය අහිමි වන ස්ථිර සේවකයන් 10 දෙනාට වන්දි ගෙවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2011 අප්‍රේල් 04 දිනැති චක්‍රලේඛ අංක 3/2011 හි විධිවිධාන අදාල කර ගැනීමට කාර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා හා කම්කරු කොමසාරිස්වරයා (කාර්මික සම්බන්ධතා) එකඟතාවය පල කර තිබුණි. 2011 ඔක්තෝම්බර් 07 දිනැති අංක අමප/11/1679/515/017-1 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ඊට අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ නමුත්, අනුමත වන්දි ගෙවීමේදී චක්‍රලේඛයට පටහැනිව වන්දි ගණනය කිරීම හේතුවෙන් රු.4,181,780 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.5 **අක්‍රීය අරමුදල්**

1997 සහ 1999 වර්ෂවලදී එකතුව රුපියල් මිලියන 13 ක මුදලක් භාණ්ඩාගාරයේ පොදු තැන්පත් ගිණුම යටතේ තැන්පත් කර තිබුණද මෙම තැන්පතු සඳහා පොලී ගෙවීමක්ද සිදු නොකරන බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මණ්ඩලය වෙත දන්වා එවා තිබුණි.

4. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

4.1 **අධ්‍යක්ෂ මණ්ඩලය**

2003 ජූනි 02 දින දරන පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 වගන්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර රැස්වීම් පවත්වා ඒ අනුව තීරණ ගත යුතු වුවත් 2009 වර්ෂයේ සිට මණ්ඩලයේ කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොතිබුණි.

4.2 **සංයුක්ත සැලැස්ම**

ඉහත (4.1) හි සඳහන් චක්‍රලේඛයේ 5.1.1 සහ 5.1.2 වගන්ති ප්‍රකාර සමාලෝචිත වර්ෂය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර සැලැසමක් පිළියෙල කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 4.4 <u>අයවැය ලේඛන පාලනය</u>

2010 සහ 2011 ගිණුම් වර්ෂ සඳහා මණ්ඩලය විසින් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 5. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) අරමුදල් භාවිතය

(ආ) සේවක වන්දි ගෙවීම

(ඇ) ලැබිය යුතු ගිණුම්